# කුතුහලය සංසිඳවන පර්යේෂණ මහගෙදර

# NIFS හෙවත් ජාතික මූලික අධ්‍යයන ආයතනය




■ සුදීප ලක්ෂාන්

මෙරට ජාතික සංවර්ධනය සහ විද්‍යාවේ දියුණුවට දායකවන ආයතන අතරින් ජාතික මූලික අධ්‍යයන ආයතනය (National Institute of Fundamental Studies - NIFS) ප්‍රධාන තැනක් අත්පත් කර ගනී. පුරා වසර 43කට අධික කාලයක් තිස්සේ මෙරට විද්‍යා ක්ෂේත්‍රයට NIFS මඟින් ලබා දී ඇති පන්නරය අති මහත් ය. ස්වාභාවික සහ සමාජ විද්‍යාවන් මෙන්ම දර්ශනය පිළිබඳ පර්යේෂණ සිදු කිරීමේ මූලික අරමුණු සහිතව පාර්ලිමේන්තු පනතක් යටතේ පිහිටුවා ඇති එකම ආයතනය මෙයයි.

මූලික පර්යේෂණ යනු කුතුහලය සංසිඳවා ගැනීම පිණිස සිදු කරන පර්යේෂණයි. ව්‍යවහාරික පර්යේෂණ යනු ඉල්ලුම මත පදනම් වූ යම් කාර්යයක් පහසු කරවීම සඳහා සිදු කරන පර්යේෂණයි. මේ අනුව ව්‍යවහාරික පර්යේෂණවල මූලාරම්භය වනුයේ මූලික පර්යේෂණයි. ඊශ්‍රායලයේ වයිස්මාන් ආයතනය, ඉන්දියාවේ ටාටා ආයතනය, ජර්මනියේ මැක්ස් ප්ලාන්ක් ආයතනය වැනි මෙවැනි ආයතන ලොව රටවල් කිහිපයක දක්නට ලැබේ. එහෙත් ලංකාවේ පැවති බොහෝමයක් පර්යේෂණ ආයතන ව්‍යවහාරික විද්‍යා පර්යේෂණ ආයතනයි.

මෙරට ජාතික සංවර්ධනය සඳහා මූලික පර්යේෂණවල වැදගත්කම හඳුනාගත් එවකට ජනාධිපති වූ ජේ. ආර්. ජයවර්ධන මහතාගේ සංකල්පයකට අනුව, මූලික විද්‍යා පර්යේෂණ අඩුව පිරවීම සඳහා 1981 දී මූලික අධ්‍යයන ආයතනය (Institute of Fundamental Studies - IFS) 1981 අංක 55 දරණ මූලික අධ්‍යයන ආයතන පනත යටතේ පිහිටුවා තිබේ. මුල දී කොළඹ ප්‍රදේශයේ කුලියට ගත් නිවාස දෙකක් තුළ ක්‍රියාත්මක වූ ආයතනය සඳහා 1985 දී, මහනුවර නගරයට ආසන්නව පිහිටි හන්තාන ප්‍රදේශයේ සුන්දර, නිස්කලංක වටපිටාවක පිහිටා තිබූ හන්තාන හෝටලය මිලට ගෙන වර්තමාන NIFS ආයතනය ගොඩනඟා තිබේ. ඒ මහාචාර්ය සිරිල් පොන්නම්පෙරුම මහතා අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කරන කාලයේ දී ය. 1980 දශකයේ අගභාගයේ දී ජපානයෙන් ලැබුණු JICA මූල්‍යාධාර ප්‍රදානය නිසා, අති නවීන පර්යේෂණාගාර පහසුකම් සහිතව මේ ආයතනය ස්ථාපිත කරන ලදි. මුල දී මෙය ජනාධිපති ලේකම් කාර්යාලය යටතේ පරිපාලනය වූ අතර, ජනාධිපතිවරයා පාලක මණ්ඩලයේ සභාපතිවරයා ලෙස කටයුතු කළේ ය. පසුකාලීනව මෙහි පරිපාලනය වෙනස් විය. ඒ අනුව වර්තමානයේ විද්‍යා හා තාක්ෂණ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මෙහි දැනට පර්යේෂණ කාර්ය මණ්ඩලය විද්‍යාඥයින් 27කින් සමන්විත වන අතර එයින් 18 දෙනෙක් ස්ථිර සේවයේ යෙදෙන විද්‍යාඥයින්ය. නව දෙනෙක් කොන්ත්‍රාත් පදනම යටතේ සේවය කරති. NIFSහි සේවයේ නියුතු විද්‍යාඥයින් බොහෝමයක් ලෝකයේ විද්‍යාඥ ශ්‍රේණිගත කිරීම්වලට අනුව ඉහළ මට්ටමක සිටියි. එසේම ලංකාවේ පර්යේෂණාගාර සහ විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීමට අනුව NIFS මුල් හතරවන ස්ථානය හිමි කර ගෙන තිබේ.

පර්යේෂණ දෙපාර්තමේන්තු 6ක් යටතේ විවිධ තේමාත්මක පර්යේෂණ ක්ෂේත්‍ර 16ක් කෙරෙහි අවධානය යොමු කරමින් පර්යේෂණ සිදු කෙරේ. ශ්‍රී ලංකාවේ දැවෙන ජාතික මට්ටමේ ගැටලුවලට ප්‍රතිචාරයක් ලෙස NIFS දීර්ඝ කාලයක් තිස්සේ පර්යේෂණ සිදු කරයි.

## NIFS මඟින් සිදු කරන සේවා

**මූලික විද්‍යා පර්යේෂණ සිදු කිරීම** - මේ යටතේ ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව, පාරිසරික විද්‍යාව සහ සමාජ විද්‍යාව වැනි විෂයයන් ආවරණය කරමින් පර්යේෂණ සිදු කිරීම.

**විද්‍යා අධ්‍යාපනය සහ පුහුණුව** - සාමාන්‍ය පෙළ විභාගයෙන් ඉහළ සාමාර්ථ ලබා ගත් සිසුන්ට නේවාසික පුහුණු වැඩසටහන් පැවැත්වීම, එක් දින පුහුණු වැඩසටහන් පැවැත්වීම, විද්‍යා අධ්‍යාපනය පාසල් සිසුන් අතර ප්‍රචලිත කිරීම සඳහා පාසල් විද්‍යා වැඩසටහන් (School Science Program) ආරම්භ කර පවත්වාගෙන යාම, ඉහළ සාමාර්ථ සහිත පූර්ව විශ්වවිද්‍යාල සිසුන් සඳහා විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන තෙක් පුහුණුව ලබා දීම වැනි සේවාවන් රැසක් ඉටු කරයි. විද්‍යා පශ්චාත් උපාධි හදාරන සිසුන් පුහුණු කිරීම ද මෙම ආයතනය විසින් කෙරෙන වැදගත් කාර්යයකි. විශ්වවිද්‍යාල හෝ පශ්චාත් උපාධි ආයතන හැරුණුකොට පූර්ණ කාලීන පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් සහිත එකම ආයතනය ද මෙයයි.

**දැක්ම (Vision)**

**මූලික අධ්‍යන ක්ෂේත්‍රයේ පර්යේෂණ සඳහා ලොව ප්‍රසිද්ධ කීර්තිමත් මධ්‍යස්ථානයක් වීම.**

**මෙහෙවර (Mission)**

**ජාතික සංවර්ධනයට දායක වන, විද්‍යාත්මක දැනුම වැඩි දියුණු කිරීම සහ මානව සම්පත් සංවර්ධනය සඳහා මූලික අධ්‍යයන ක්ෂේත්‍රයේ උසස් පර්යේෂණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒවායේ නිරත වීම.**

**විද්‍යා කටයුතුවලට මහජන සහභාගීත්වය තහවුරු කිරීම** - මහජන සම්මන්ත්‍රණ, ප්‍රදර්ශන, සාකච්ඡා සහ වැඩමුළු පැවැත්වීම, ජනතාව අතර විද්‍යා සාක්ෂරතාව සහ දැනුවත් භාවය ප්‍රවර්ධනය කිරීම, පුවත්පත් ලිපි, රූපවාහිනී වැඩසටහන් සහ සමාජ මාධ්‍ය ජාල ඔස්සේ තොරතුරු හා දැනුම බෙදා ගැනීම.

**ජාත්‍යන්තර සහ ජාතික සහයෝගිතාව පවත්වා ගැනීම** - ගෝලීය පර්යේෂණ ආයතන සහ විශ්වවිද්‍යාල සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම.

**අති නවීන රසායනාගාර සහ පර්යේෂණ උපකරණ සේවාවන් ලබා දීම.**

**පාරිසරික සහ තිරසර සංවර්ධන පර්යේෂණ, ජෛව විවිධත්ව සංරක්ෂණය සහ දේශගුණ විපර්යාස පිළිබඳ අධ්‍යනයන් සිදු කිරීම.**

**රටේ සංවර්ධනයට දායක වන විද්‍යා ප්‍රතිපත්ති සහ පර්යේෂණ ප්‍රමුඛතා පිළිබඳව රජයට උපදෙස් දීම.**

**දැනුම ව්‍යාප්තිය සහ ප්‍රකාශන** - විද්‍යා සඟරා, ජර්නල්, පර්යේෂණ වාර්තා ප්‍රකාශයට පත් කිරීම.

## NIFS දැනට සිදුකරනු ලබන පර්යේෂණ

NIFS මඟින් වර්තමානයේ විවිධ ක්ෂේත්‍රවලට අයත් පර්යේෂණ රාශියක් සිදු කරයි.

- පරිසර විද්‍යාව සහ පාරිසරික ජීව විද්‍යාව
- ක්ෂුද්‍ර ජෛව තාක්ෂණය
- රයිසෝබියම් ආමුකුලන පරීක්ෂණ



මහාචාර්ය සිරිල් විජේසුන්දර

- ක්ෂුද්‍ර ජීව විද්‍යාව සහ පාංශු පාරිසරික පද්ධතීන්
- අණුක ජීව විද්‍යාව සහ මානව රෝග
- පෝෂණ ජෛව රසායනය
- ශාක වර්ගීකරණය සහ සංරක්ෂණය
- භෞතික විද්‍යාත්මක සංසිද්ධි
- බලශක්තිය සහ රසායන විද්‍යාව
- ද්‍රව්‍ය සැකසීම සහ උපාංග නිෂ්පාදනය
- නැනෝ තාක්ෂණය
- ජල තත්ත්ව පර්යේෂණ යනු මේ අතරින් කිහිපයකි.

වර්තමානයේ NIFS හි වැඩබලන අධ්‍යක්ෂක ලෙස කටයුතු කරන මහාචාර්ය සිරිල් විජේසුන්දර මහතා ආයතනය ගැන මෙසේ පැවසීය. ''අප රටේ මූලික පර්යේෂණ සඳහාම පිහිටුවා ඇති එකම ආයතනය NIFS ආයතනයයි. රටේ ළමා, තරුණ පරපුර විද්‍යාවට නැඹුරු කරන්න, අලුතෙන් හිතන්න අප ආයතනයෙන් විශාල පන්නරයක් ලබා දෙනවා. අප ආයතනය සිදු කරන සේවාවන් නිසා විද්‍යාවට නැඹුරු වී වර්තමානයේ රටට ලොකු සේවයක් කරන විද්‍යාඥයින් පිරිසක් බිහි වී තිබෙනවා.''

නිල නොලත් විද්‍යා නගරයක් මෙන් වූ මහනුවර නගරයේ හන්තාන ප්‍රදේශයේ පිහිටා ඇති NIFS ශ්‍රී ලංකාවේ මූලික අධ්‍යයන සඳහා ක්‍රියාකාරීව දායක වන ප්‍රමුඛ ආයතනයක් ලෙස කටයුතු කරයි. මෙමඟින් ජාතික සංවර්ධනය මෙන්ම ගෝලීය විද්‍යා දියුණුව කෙරෙහි ද සැලකිය යුතු දායකත්වයක් ලබා දෙයි.

ලිපිනය:

ජාතික මූලික අධ්‍යයන ආයතනය
හන්තාන පාර
මහනුවර

දුරකථන අංක: 081 2232106, 081 2232107, 081 2232131

විද්‍යුත් තැපැල් ලිපිනය: info@nifs.ac.lk

වෙබ් අඩවිය: www.nifs.ac.lk ■